**එච්. එම්. විජිත හේරත්, පා. ම.**
எச். எம். விஜித ஹேரத், பா. உ.
**H. M. Vijitha Herath, M. P.**

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය**
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சர்
**Minister of Foreign Affairs, Foreign Employment and Tourism**

---

**2025** අප්‍රේල් **14** වැනි දින

සිංහල සහ දෙමළ අලුත් අවුරුද්ද සමරනු ලබන මේ මොහොතේ, ශ්‍රී ලංකාවේ සහ ලොව පුරා වෙසෙන සියලුම ලාංකිකයන්ට මාගේ සුබ පැතුම් පිරිනමමි.

විවිධ ප්‍රජාවන් විසින් සමරනු ලබන මෙම නව ආරම්භයක් සනිටුහන් කිරීමේ සමය, එකමුතුකමේ, සහජීවනයේ සහ බෙදාහදා ගත් සංස්කෘතික වටිනාකම්වල හරය පිළිබිඹු කරනවා. එකිනෙකට වෙනස් වූ සම්ප්‍රදායන් තුළ මුල් බැස ගත්ත ද, අපගේ බහුත්ව සමාජයේ ස්ථාවරය පෙන්නුම් කරමින්, සහජීවනයෙන් යුතුව මෙම අලුත් අවුරුද්ද සමරනු ලබනවා.

ගෝලීය ප්‍රජාව අතර දිනෙන් දින තීව්‍ර වන බෙදීම් සහ අවිනිශ්චිතතාවයන්ට මුහුණ දෙන තත්කාලයේ, මේ අලුත් අවුරුදු උදාව ලබා දෙන සාමකාමී සහජීවනයේ ජීවගුණය කාලෝචිත හා ප්‍රබල පණිවිඩයක් නිරූපණය කරනවා. මෙය ජාතීන් තුළ මෙන්ම එක් එක් ජාතීන් අතරත් සංවාදයේ, අන්‍යෝන්‍ය ගෞරවයේ සහ සහයෝගීතාවයේ වැදගත්කම අපට සිහිපත් කරනවා.

ජාත්‍යන්තර ප්‍රජාව සමඟ සබඳතා ශක්තිමත් කිරීමට, විදෙස්ගත ලාංකිකයන්ගේ අයිතිවාසිකම් සහ ගරුත්වය සුරැකීමට සහය වීමට සහ ශ්‍රී ලංකාව සාමයේ, ආගන්තුක සත්කාරයේ සහ සංස්කෘතික පොහොසත්කමේ ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට අපගේ රජය කැපවී සිටිනවා.

මෙම අලුත් අවුරුද්ද සැමට නව අපේක්ෂාවන් සහ සෞභාග්‍යය ළඟා කරදෙන, අවබෝධයකින් සපිරි වසරක් වේවායි මා ප්‍රාර්ථනා කරනවා.

සුබ නව වසරක් වේවා!
இனிய புத்தாண்டு நல்வாழ்த்துக்கள்!
Happy New Year!

**එච්. එම්. විජිත හේරත්, පා.ම.**
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

---

කාර්යාලය/அலுவலகம்/Office: +94-11-2430221, +94-11-2445498 ෆැක්ස්/பெக்ஸ்/Fax No. : +94-11-2430222
වෙබ් අඩවිය/வலைத்தளம்/Website: www.mfa.gov.lk - ඊමේල්/மின்னஞ்சல்/Email: fmo@mfa.gov.lk
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 01, ශ්‍රී ලංකාව
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு, குடியரசுக் கட்டிடம், கொழும்பு 01, இலங்கை.
Ministry of Foreign Affairs, Foreign Employment and Tourism, Republic Building, Colombo 01. Sri Lanka.